ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 16/09/2021.

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩබ්ලිව්.ජ්.පී. වන්නිආරච්චි මහතා,<br>ආනන්දපුර, බලහතුව,<br>ඌව, කුඩාඔය. |
| වින්දිත පාර්ශවය | : | 01. ඩබ්ලිව්.ජ්.පී.වන්නිආරච්චි මහතා<br>02. නිමල් වන්නිආරච්චි මහතා |
| වගඋත්තර පාර්ශවය | : | 01. ස්ථානාධිපති,<br>අපරාධ අංශය,<br>පොලිස් ස්ථානය,<br>තණමල්විල.<br>02. උ.පො.ප. උදයංග මහතා,<br>පොලිස් ස්ථානය,<br>තණමල්විල. |

පැමිණිලි අංකය : HRC/537/15

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015.02.05 වන දින තම සහෝදරයා වන නිමල් යන අයව තණමල්විල පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බවට දැනගැනීමෙන් පසුව තමා පදිංචිව සිටින ගනේමුල්ල සිට තණමල්විල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට දුරකථන ඇමතුමක් ලබාදුන් බවයි. එහිදී තම සහෝදරයාව අත්අඩංගුවට ගත් බවට දන්වා පැමිණිලිකරුටද පොලිසියට එන ලෙසට දැනුම්දුන් බැවින් එදිනම රාත්‍රියේ මොණරාගල බසයක නැගී 2015.02.06 වන දින උදේ 9.00 ට පමණ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තණමල්විල පොලිස් ස්ථානයට ගිය බවත්, ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකරුගෙන් ගංජා ඉල්ලූ බවත්, පැමිණිලිකරු ගංජා තමා ලග නොමැති බව ප්‍රකාශ කිරීමෙන් පසුව ස්ථානාධිපතිවරයා පැමිණිලිකරුව අපරාධ අංශයේ උප පොලිස් පරීක්ෂක උදයංග නිලධාරී වෙත භාරදුන් බවත්, ඔහු තමාගෙන් ගංජා ඉල්ලා සිටි බවත්, තමා ලග ගංජා නොමැති බව ප්‍රකාශ කල විට බංකුවේ ඉන්දවා අත්දෙක බැද, අත් දෙක බංකුව යටින් රිංගවා මාංචු දමා උදයංග මහතා තමාගේ බඩ උඩින් ඉදගත් බවත්, මුහුණ වැසෙන සේ බැනියමක් දැමූ බවත්, පසුව සැර හෝස් එකකින් තමාගේ නාසයට සහ කටට වතුර ඇල්ලූ බවත්, එමනිසා හුස්ම ගැනීමට නොහැකි වූ බවත්, පසුවටද පහර දුන් බවත්, එසේ පැය 1 1/2 ක් පමණ වද දුන් බවත් ප්‍රකාශ කර ඇත. පසුව තම සොහොයුරාවද එම ස්ථානයට ගෙන්වා ගත් බවත්, උදයංග මහතා තමා වෙත පා පහරක් ගැසූ බවත්, ඉන්පසුව බැමි ලිහා සිර මැදිරියට දැමූ බවත්, පසුව තම සොහොයුරාටද එසේ වද දුන් බවත්, පැමිණිලිකරුව 2015.02.07 වන දින රාත්‍රී 7.00 ට පමණ නිදහස් කල බවත්, සොහොයුරාව වැල්ලවාය අධිකරණය වෙත ඉදිරිපත් කල බවත්, පහරදීම නිසා 2015.02.08 දින අමාරුවූ නිසා තමා හම්බන්තොට රෝහලට ඇතුලත්වී ප්‍රතිකාර ලබාගත් බවත් වැඩිදුරටත් සදහන් කර ඇත.

**පැමිණිලි පාර්ශවය විසින් පැමිණිල්ල තහවුරු කිරීම සදහා ඉදිරිපත් කර ඇති සාක්ෂි :-**

හේවයලාගේ ජයන්ත කුලරත්න, යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් පැමිණිලිකරු සහ ඔහුගේ සහෝදරයා බැලීමට 2015.02.06 වන දින පොලිසියට ගිය විට ඒ සදහා අවසර නොදුන් බවත්, 2015.02.07 වන දින පොලිසියට ගිය බවත්, එදින ඔවුන්ව බැලීමට අවසර ලබාදුන් බවත්, පැමිණිලිකරු සහ ඔහුගේ සහෝදරයා පොලිස් සිර කුඩුවේ සිටි බවත්, ඔවුන්ගේ අත් ඉදිමී තිබූ බවත්, පොලිසියෙන් ඔවුන්ට පහරදුන් බව තමාට ප්‍රකාශ කල බවත් සදහන් කර ඇත.

රංජනී වන්නිආරච්චි යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එහි සදහන් වන්නේ තම බාල මල්ලී (පැමිණිලිකරු) 2015.02.06 දින කොළඹ සිට තම නිවසට පැමිණි බවත්, ඒ වනවිට ලොකු මල්ලී වන නිමල් යන අයව පොලිසියෙන් අත්අඩංගුවට ගෙන තිබූ බවත්, ඔහු බැලීමට බාල මල්ලී වන ප්‍රියන්ත වන්නිආරච්චි යන අය පොලිසියට ගිය බවත්, එවිට ප්‍රියන්ත වන්නිආරච්චි යන අයවද අත්අඩංගුවට ගෙන ඇති බවත්ය. තමා 2015.02.07 වන දින තණමල්විල පොලිසියට ගිය බවත්, සහෝදරයන් දෙදෙනාම කුඩුවේ සිටි බවත්, ඔවුන්ට පහරදුන් බවට තමාට ප්‍රකාශ කල බවත්, දෙදෙනාගේම අත් දෙක තුවාල වී තිබූ බවට තමා දුටු බවත්, තම බාල සොහොයුරා එදින රාත්‍රී 8.00 ට පමණ නැවත තම නිවසට පැමිණිය බවත්, ඔහුට එදින රාත්‍රී අසනීප වූ නිසා පසුදින රෝහල් ගත කල බවත් සදහන් කර ඇත.

සේනාරත්න මුදියන්සේලාගේ සේනාරත්න යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එහි සඳහන් වන්නේ 2015.02.06 වන දින පැමිණිලිකරුව සහ ඔහුගේ සහෝදරයා වන නිමල් යන අයව බැලීමට පොලිසියට ගිය ද ඔවුන් බැලීමට අවස්ථාව ලබානොදුන් බවත්, 2015.02.07 වන දින නැවත පොලිසියට ගිය බවත්, ඔවුන් දෙදෙනා පොලිස් මැදිරියේ සිටි බවත්ය. ඔවුන් හට පොලිසියෙන් පහරදුන් බව තමාට ප්‍රකාශ කර සිටි බවද ඔවුන්ගේ අත් තුවාල වී ඉදිමී තිබූ අතර ඒවා තමාට පෙන්වූ බවද සඳහන් කර ඇත.

නිමල් වන්නිආරච්චි යන අයට පහරදීමක් සිදුකළ බවට වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ගරු මහේස්ත්‍රාත්වරයා වෙත 2015.02.07 වන දින දැනුම්දී ඇත. එය නඩු වාර්තාවේ සඳහන් වේ.

මෙම අයව අධිකරණ නියෝග අනුව බන්ධනාගාර රෝහලේ රෝහල් ගත කර ඇති අතර, බන්ධනාගාර රෝහලෙන් ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තාව අනුව සඳහන් වන්නේ, අත් දෙක දෙපැත්තේ, පපුවේ යට ප්‍රදේශය සහ වලලුකර වේදනාවක් ඇති බවත්, වම් අතේ වැලමිට සහ වලලු කර අතර සීරීම් තුවාල සහ වලලු කර ප්‍රදේශය ඉදිමී ඇති බවත්ය.

පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව වම් මැණික් කටුවේ සිට සෙ.මී. 4 ක් උසින් වම් බාහුවේ සෙ.මී. 4 x 2 වූ සීරීමක් සහ දකුණු මාපටගිල්ල වම්පසට වන්නට (මාපටගිල්ලේ මුදුනේ සිට සෙ.මී. 4 ක් දුරින්) සෙ.මී. 1 x 1 වූ සීරීමක් සහිත බරපතල නොවන තුවාල 02 ක් ඇති බවට සඳහන් වේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

පළවන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කේ.ජී.එස්.ආර්.උදයංග මහතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිල්ලේ සඳහන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකරු වන ඩබ්ලිව්.ඒ. ප්‍රියන්ත යන අයව අත්අඩංගුවට ගැනීමක් සිදුනොකළ බවත්ය. පැමිණිල්ලේ සඳහන් අනෙක් අය වන නිමල් වන්නිආරච්චි යන අයව සහ එච්.එම්.ජේ. ශාන්ත යන අයවළුන් ගංජා කිලෝ ග්‍රෑම් 100 ක් සමග 2015.02.06 වන දින අත්අඩංගුවට ගත් බවයි. පහරදීම සම්බන්ධයෙන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සහ පහරදීම සම්බන්ධයෙන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්ය. අත්අඩංගුවට ගත් සැකකරුට විරුද්ධව වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයේ 106/2015 යටතේ නඩුවක් ගොනු කර ඇති බවද දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු වන ප්‍රියන්ත වන්නිආරච්චි යන අයගේ පැමිණිල්ල විමර්ශනය කිරීමේදී ඊට සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණි පොලිස් අත්අඩංගුවේ සිටි නිමල් වන්නිආරච්චි යන අයටද පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට එම සාක්ෂිකරු කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

ප්‍රියන්ත වන්නිආරච්චි යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පහරදීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

නිමල් වන්නිආරච්චි යන අය බන්ධනාගාර ගතව ප්‍රතිකාර ලබාගෙන ඇති අතර, එම වෛද්‍ය වාර්තාව අනුව පහරදීම සිදුකර ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව පහරදීමේ ආකාරය හා වෛද්‍ය වාර්තාවේ වූ තුවාල ද සැසදෙන බව නිරීක්ෂණය වේ.

ප්‍රියන්ත වන්නිආරච්චි යන අයව අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කල ද, පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි සහ දිවුරුම් ප්‍රකාශ වලට අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

නිමල් වන්නිආරච්චි යන අයට විරුද්ධව ගංජා ලග තබා ගැනීම යටතේ නඩුවක් විභාග වන බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

වගඋත්තරකරුවන් විසින් ප්‍රියන්ත වන්නිආරච්චි යන අයව අත්අඩංගුවට ගෙන නොමැති බවට කරුණු ඉදිරිපත් කල ද, හේවයලාගේ ජයන්ත කුලරත්න, රංජනී වන්නිආරච්චි සහ සෙනරත් මුදියන්සේලාගේ සේනාරත්න යන අයගේ දිවුරුම් ප්‍රකාශ වලින් ප්‍රියන්ත වන්නිආරච්චි යන පැමිණිලිකරුව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන සිටි බවට තහවුරු වේ.

එසේම, පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පහරදීමක් සිදුකර ඇති බවටද තහවුරු වේ. තවද, නිමල් වන්නිආරච්චි යන අයගේ වෛද්‍ය වාර්තාව අනුව ඔහුට ද පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වේ.

මේ අනුව ප්‍රියන්ත වන්නිආරච්චි යන අයව අත්අඩංගුවට ගෙන ඇත්තේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13(1) යටතේ එනම්, නීතියෙන් නියම කොට ඇති ආකාරයෙන් නොවන බැවින් ද, ඔහුව රඳවා තබාගෙන ඇත්තේ 13(2) යටතේ නීතියෙන් නියම කර ඇති ආකාරයෙන් නොවන බැවින් ද, එසේම අත්අඩංගුවට ගැනීමෙන් පසුව වධහිංසාවට ලක්කිරීමක් සිදුකර ඇති බැවින් ද, මෙම අයගේ මූලික අයිතිවාසිකම් එනම්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව, 13(1) ව්‍යවස්ථාව සහ 13(2) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු නඩුවේ දක්වා ඇත්තේ, කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවූවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පොලිස් නිලධාරින් වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තහවුරු කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හා අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතු බවයි.

ඒ අනුව නිමල් වන්නිආරච්චි යන අය අත්අඩංගුවට ගැනීමෙන් පසුව පහරදීමක් සිදුකර ඇති බව තහවුරු වන හෙයින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවද මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

රත්නපාල එරෙහිව ධර්මසිරි නඩුවේ දී අධිකරණය නිරීක්ෂණය කර ඇත්තේ, වධහිංසාවන්ට ගොදුරු වූවන්ට වැරදි කළ අය විසින් පෞද්ගලිකව වන්දි ගෙවිය යුතු බවට ආඥා කරමින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය දඬුවම් නියම කර ඇතත්, මේ සම්බන්ධයෙන් ප්‍රබල බලපෑමක් සිදුවී නැති බැවින්, පොලිස් ස්ථාන වල සිදුකරනු ලබන වධහිංසා කිසිදු බාධාවකින් තොරව දිගින් දිගටම සිදුකරගෙන යන බවට පෙනී යන බවයි.

එමනිසා වධහිංසාව තුරන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ද අවධානයට විශේෂයෙන්ම යොමු කළ යුතුය.

**නිර්දේශය :-**

01. වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ 11 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට නිගමනය කරන හෙයින්, පැමිණිලිකරු මෙන්ම දෙවන වින්දිත වශයෙන් දක්වා ඇති නිමල් වත්තිආරච්චි යන අයට වගඋත්තරකරුවන් විසින් රු. 40,000/- ක මුදලක් වින්දිතයින් දෙදෙනාටම වන්දි වශයෙන් ලබාදිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

02. තවද, වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරන බවද දන්වා සිටිමි.

2021. . වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/-